# හම්බන්තොට නගර සභාව

# හම්බන්තොට දිස්ත්‍රික්කය

01. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 10 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 ජුලි 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය.

මාගේ පරීක්ෂණයේ පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව හම්බන්තොට නගර සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2010 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිලිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා උරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

(අ) ඉකුත් වර්ෂය සහ සමාලෝචිත වර්ෂය තුළ මිළදී ගෙන තිබූ රු. 1,044,581 ක්වූ වත්කම්වල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ රු. 313,235 ක් වූ වරිපනම් බදු මුදල හා රු. 11,537 ක් වූ බදුකුලී ආදායම් කලින් ලද ආදායම් ගිණුමට බැරකල යුතු වුවත් සදොස් ලෙස ණයහිමි ගිණුමට බැරකර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය තුළ මිළදීගත් සහ පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු. 195,509 ක්වූ පුස්තකාල පොත් ප්‍රාග්ධන වත්කම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද රු. 7,810 ක මුදල ප්‍රාග්ධන වත්කම් විකුණුම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ වෙළඳපොළ කඩ කාමර කුලී වශයෙන් ලැබී තිබූ රු. 3,150 ක මුදල , ණයගැතියන් යටතේද ගිණුම්ගත කිරීම නිසා දෙවරක් ගිණුම්ගත වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ ගබඩා භාණ්ඩ නිකුත් කිරීම්වල වටිනාකම රු. 1,898 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ දරන ලද රු. 78,091 ක්වූ වියදම් , ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම් ගතකරනු වෙනුවට පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඌ) 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව 2010 දෙසැම්බර් 10 වන දින භාණ්ඩ හා උපකරණ විෂයයන් 48 ක් වෙන්දේසි කර තිබූ නමුත් ඒවායේ පිරිවැය වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු රු.4,677,740 ක් වූ තානායම් ගාස්තු ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය සඳහා වීථි පහන් නඩත්තු කටයුතු වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය වියයුතු රු. 190,380 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) හම්බන්තොට බස් නැවතුම්පොළ විදුලි බිල්පත් පියවීම වෙනුවෙන් 2010 නොවැම්බර් හා දෙසැම්බර් මාස වෙනුවෙන් ලැබිය යුතු රු. 20,615 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ ආදායම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 <u>නොසැසඳු පාලන ගිණුම්.</u>

ගිණුම් විෂයයන් 02 කට අදාලව පාලන ගිණුම් අනුව ශේෂයන්ගෙ එකතුව රු.6,138,542 ක් වු අතර, උපයෝගී ලේඛණ අනුව වටිනාකම රු.4,731,574 ක් වූයෙන් වෙනස රු.1,406,968 ක් විය.

1.3.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නසා රු. 9,700,234 ක් වු වත්කම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 <u>දිගුකල් පරිශේෂව පවත්නා ශේෂයන්</u>

අදාල ගැලපීම් කර නිරවුල් කිරීමට කටයුතු නොකිරීම නිසා හිඟහිටි විදුලිය ගාස්තු රු.957,424 ක් දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය පකාශනවල දක්වා තිබුණි.

1.3.5 <u>නීති, රීති රෙගුලාසි වලට අනුකූල නොවීම්.</u>

පහත දැක්වෙන නීති, රීති , රෙගුලාසි විධිවිධාන වලට හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.</u>

(i) මු.රෙ. 371 (2) ප්‍රකාරව යම් කාර්යයක් සඳහා දෙන ලද අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙන ලද රු. 26,070 ක් වු අත්තිකාරම් මුදල් පියවා නොතිබුණි.

(ii) මු.රෙ. 1645 හා1646 ප්‍රකාරව මාසික වාහන සංසිද්ධි සාරාංශ සමඟ දෛනික ධාවන සටහන් පත් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුලදී වාහන 3 ක ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) <u>දකුණු පළාත් සභා මුදල් රීති සංග්‍රහය</u>

223.1 රීතිය ප්‍රකාරව නිලධාරීන් විසින් කවර ආකාරයකින් හෝ පළාත් සභා මුදල් පෞද්ගලික ගිණුමක තැන්පත් කිරීම තහනම් වුවත් ඊට පටහැනිව නගර සභාවේ කළමණාකරණ සහකාර II නිලධාරිණියක් සභාව සතු රු. 59,246 ක් වු මුදල් තම පෞද්ගලික ගිණුමේ සති 03 කට ආසන්න කාලයක් රඳවා ගෙන පරිහරණය කර තිබුණි.

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු: 112,005 ක් වු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු: 4,882,662 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය.

------------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 3,120 | 2,495 | 1,699 | 3,150 | 2,460 | 2,917 |
| බදුකුළී | 6,025 | 8,442 | 2,437 | 7,968 | 5,910 | 2,057 |
| බලපත්‍ර ගාස්තු | 505 | 505 | - | 721 | 721 | - |
| සේවා සඳහා ගාස්තු | 2,021 | 2,360 | 98 | 2,127 | 1,773 | 354 |
| වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 325 | 325 | - | 561 | 561 | - |
| වෙනත් ආදායම් | 655 | 360 | 295 | 2,113 | 2,113 | - |

### 2.2.2 හිඟ වරිපනම් බදු

නගර සභා ආඥා පනතේ 170 (1) හා (2) වගන්තිප්‍රකාර සමාලෝචිත වර්ෂය අවසානය වන විට සභාවට අයවිය යුතු රු. 2,079,777 ක් වූ හිඟ වරිපනම් බදු මුදල් අයකර ගෙන නොතිබුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයට අදාල සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම, අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| පුනරාවර්තන වියදම් | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පෞද්ගලික පඩිනඩි | 23,247 | 21,579 | 1,668 | 19,175 | 19,500 | (325) |
| අනෙකුත් | 9,245 | 8,708 | 537 | 8,778 | 8,476 | 302 |
| උප එකතුව | 32,492 | 30,287 | 2,205 | 27,953 | 27,976 | (23) |
| ප්‍රාග්ධන වියදම් | 1,710 | 8,336 | (6,626) | 1,100 | 2,526 | (1,426) |
| මුළු එකතුව | 34,202 | 38,623 | (4,421) | 29,053 | 30,502 | (1,449) |

2.4 මානව සම්පත් කළමණාකරණය

2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 02 | 01 |
| ද්විතියික | 17 | 15 |
| ප්‍රාථමික | 47 | 39 |
| වෙනත් (අනියම්,තාවකාලික) | - | 47 |

(ආ) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 , 2006 මැයි 10 දිනැති අංක 28 (i) හා 2006 අගෝස්තු 01 දිනැති අංක 28 (ii) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව විධිමත් අනුමැතියක් නොමැතිව සභාව විසින් අනියම් හා තාවකාලික සේවකයින් 47 දෙනෙකු බඳවාගෙන සේවයේ යොදවා වැටුප් ගෙවා තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය.

### 2.5.1 ලැබිය යුතු ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 3,824,184 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු. 957,424 ක් විය.

### 2.5.2 අයවීමට ඇති සේවක ණය.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 2,284,186 ක් විය.

(ආ) සභාවේ සේවයේ යෙදී සිට ස්ථාන මාරුවී ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු වූ රු. 159,838 ක් වූ සේවක ණය ශේෂ, එකවර අය නොකොට වාරික වශයෙන් අයකර ගනිමින් තිබුණි.

### 2.5.3 අචල ජංගම වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 කට වඩා වැඩි කාලයක් ඉක්මවා අචලව පවතින පොදු ගබඩා වත්කම්වල අගය රු. 19,531 ක් විය.

## 2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

නගර සභාව විසින් 2009 වර්ෂයේ පළාත් පාලන සතිය හා තොරතුරු තාක්ෂණ දිනය වෙනුවෙන් වෙබ් අඩවියක් ආරම්භ කර පවත්වාගෙන යාම වෙනුවෙන් 2010 වර්ෂය තුලදී රු. 72,680 ක මුදලක් වැයකර තිබුණි. වෙබ් අඩවිය ස්ථාපිත කර ක්‍රියාත්මක කර තිබුණේ සති දෙකක් වැනි කෙටි කාලයක් පමණක් බව නිරීක්ෂණය වූ අතර, විධිමත් අධ්‍යයනයකින් තොරව ඉහත ව්‍යාපෘතිය සඳහා මුදල් ගෙවීම සහ ව්‍යාපෘතිය අතහැර දැමීම කළමණාකරණයේ අකාර්යක්ෂමතාවයක් වශයෙන් නිරීක්ෂණය කෙරේ.

## 2.7 පොත්පත් හා ලේඛන පවත්වාගෙන යාමේ අඩුපාඩු.

සභාව විසින් පවත්වාගෙන යායුතු ලේඛන 03 ක් විධිමත්ව හා යාවත්කාලිනව පවත්වා නොතිබූ අතර සභාව විසින් පවත්වාගෙන යායතු ලේඛන 03 ක් පවත්වා නොතිබුණි.

2.8 <u>අභ්‍යන්තර විගණනය.</u>

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. <u>පද්ධති හා පාලන.</u>

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ණයහිමි /ණයගැති පාලනය

(ඉ) ගබඩා පාලනය